ජනපති හටන



මාස කිහිපයක් තිස්සේ මහත් ආන්දෝලනයක් ව තිබූ ප්‍රශ්නයක් පසුගිය 26 දා විසඳුණේය. මීළඟ ජනාධිපතිවරණය 2005 වසරේ පැවැත්විය යුතු බව එක්සත් ජාතික පක්ෂය කියා සිටි අතර ආණ්ඩුව කියා සිටියේ එය 2006 වසරේ පැවැත්විය යුතු බවය. එක්සත් ජාතික පක්ෂය මෙම ප්‍රශ්නය පදනම් කරගෙන 'ජනබල මෙහෙයුම' නමින් විශාල උද්ඝෝෂණයක් අරඹා තිබිණ. අවසානයේ ජනාධිපතිනිය ඒ සම්බන්ධයෙන් අධිකරණයේ මතය විමසා සිටි අතර පසුව ජාතික හෙළ උරුමය ද මෙම ප්‍රශ්නය අධිකරණය වෙත රැගෙන ගියේ ය. ජනාධිපතිනියගේ මතය විමසීම සම්බන්ධයෙන් කිසිවක් ප්‍රසිද්ධියේ ප්‍රකාශ නොකළ ශ්‍රේෂ්ඨාධිකරණය හෙළ උරුමයේ පෙත්සම පිළිබඳ තීන්දුව දෙමින් කියා සිටියේ ජනාධිපතිවරණය 2005 වසරේ දී පැවැත්විය යුතු බවය.

ඒ අවස්ථාවේ එක්සත් ජාතික පක්ෂය රටපුරා රතිඤ්ඤා දල්වමින් සතුට ප්‍රකාශ කළ ද ඇත්ත වශයෙන් ම ඔවුන් මුලින් කියා සිටියේ අධිකරණයට මෙවැනි තීන්දුවක් දීමට බලයක් නොමැති බවයි. ඊට හේතු වූයේ ජනාධිපතිනිය 2000 වසරේ දී තමන් ඉදිරිපිට දිවුරුම් දුන් බව මීට පෙර අගවිනිසුරු සරත් නන්ද සිල්වා ප්‍රකාශ කොට තිබීම නිසා ය. අගවිනිසුරුවරයා ජනාධිපතිනියගේ මිත්‍රයෙකු වීම නිසා ඔහුගෙන් සාධාරණයක් අපේක්ෂා කළ නොහැකිය යන්න ඔවුන්ගේ අදහස විය. එහෙත් සුනාමි සහන මණ්ඩලය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය දුන්නේ ද ජනාධිපතිනියට අවාසිදායක තීන්දුවකි. මෙම තත්වය තේරුම් ගත යුත්තේ ගිලෙන නැවෙන් මියන් පනින්නේ යැයි කියන සන්දර්භය තුළය.

එක්සත් ජාතික පක්ෂය ජනාධිපතිවරණය 2005 දී පැවැත්විය යුතු යැයි කියා සිටිය දී ජනාධිපතිනිය හා ඇගේ මැති ඇමැතිවරුන් කියා සිටියේ එය 2006 වසරේ දී පැවැත්විය යුතු බවය. එහෙත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සිය ජනාධිපතිවරණ අපේක්ෂකයා ලෙස මහින්ද රාජපක්ෂ නම් කිරීමත් සමඟ මෙම තත්වය වෙනස් විය. එවිට ජනාධිපතිනියට හැර අනෙක් සියලු දෙනාට අවශ්‍ය වුණේ ජනාධිපතිවරණය 2005 දී පවත්වන්නට ය. ජනාධිපතිනියට ජනාධිපතිවරණය 2006 දී පවත්වන්නට අවශ්‍ය වූයේ අන් කිසිවක් නිසා නොව, තව වසරක් බලයේ සිටින්නට ය. ආණ්ඩුවේ අනෙක් සියලු දෙනාගේ මතය වූයේ ජනාධිපතිවරණය 2006 දී පැවැත්වීම තමන්ගේ අපේක්ෂකයාට අවාසි සහගත බවය. කෙසේ වෙතත් දන් ජනාධිපතිනිය හැර අනෙකුත් සියලු දෙනා සතුටු වන අන්දමේ තීන්දුවක් අධිකරණය මඟින් ලබා දී ඇත. ඊට අනුව සැප්තැම්බර් මස 17ත් 25ත් අතර දිනයක දී ජනාධිපතිවරණය සඳහා නාම යෝජනා කැඳවිය යුතුය.

ප්‍රමාද වී තරගයට ඇතුළු වුවද දනට පෙනෙන්නට ඇති තත්වය අනුව ඉදිරියෙන් සිටින්නේ මහින්ද රාජපක්ෂය. මැතක දී සෙදර්ලන්තයේ සමීක්ෂණ ආයතනයක් මඟින් කර ඇති සමීක්ෂණයකට අනුව, මෙරට ජනතාවගෙන් 63% ක් කල්පනා කරන්නේ මහින්ද රාජපක්ෂ මීළඟ ජනාධිපතිවරයා වනු ඇති බවය. රනිල් වික්‍රමසිංහ පැරදවීමේ පොදු අරමුණ මත අතීතයේ ඔහුට විරුද්ධව සිටි මංගල සමරවීර මේ වන විට මහින්දගේ ජනාධිපතිවරණ සටනේ ප්‍රධාන මෙහෙයුම්කරු බවට පත්ව සිටී. මංගලගේ මේ භූමිකාව මහින්දගේ ජය තහවුරු කිරීමට විශාල ශක්තියක් වනවාට සැක නැත.

මේ වන විට කුඩා කුඩා පක්ෂ ගණනාවක් මහින්දට සහය දෙන බව පවසා ඇත. පොදු පෙරමුණට අයත් පක්ෂ සේ ම, ප්‍රගතිශීලී පෙරමුණ, සිංහලේ මහා සම්මත භූමිපුත්‍ර පක්ෂය වැනි පක්ෂ ද ඔහුට සහය පළකර ඇත. එහෙත්, ජනාධිපතිවරණයේ දී ජය තහවුරු කිරීමේ ප්‍රධාන සාධකය වන ජනතා විමුක්ති පෙරමුණ තවමත් එවැනි සහයක් පල කොට නොමැත.

ජනාධිපති අසුනේ හිඳ ගැනීමට නම් මහින්ද රාජපක්ෂට ජවිපෙ සහය අනිවාර්ය වන අතර එම සහය ලබා ගැනීමට නම් ඔහුට බොහෝ කැප කිරීම්, පරිත්‍යාග කිරීම් හා අවංකභාවය සනාථ කිරීමට සිදුවනු ඇත. මෙහි දී අනිවාර්යයෙන් ජනතා විමුක්ති පෙරමුණ ඉල්ලා සිටින්නේ රට නොබෙදීමේ සහතිකයකි. නමුත් අගමැති මහින්ද රාජපක්ෂ මේ දක්වා ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් පැහැදිලි අදහසක් ප්‍රකාශ කොට නැත. ජනාධිපතිවරණය ජය ගැනීමට පමණක් නොව ඉන් පසුව ශක්තිමත් ආණ්ඩුවක් පවත්වාගෙන යෑම සඳහා ද මහින්දට ජවිපෙ සහාය අවශ්‍ය වේ. එනිසා ජවිපෙ සමඟ එකඟතාවකට පැමිණීම ගැන බරපතල ලෙස කල්පනා කිරීමට ඔහුට සිදුවනු ඇත.

මහින්ද රාජපක්ෂ පරාජය වනු ඇති බවට තර්ක කරන අය පෙන්වා දෙන්නේ ඔහුගේ සිංහල, බෞද්ධ ලකුණ හා ජවිපෙ කෙරෙහි දක්වන ලැදියාව නිසා ඔහුට සුළු ජන ඡන්ද අහිමි වනු ඇති බවය. එහෙත්, රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාගේ සාම ක්‍රියාදාමය තුළින් අසාධාරණයට ලක්වූ මුස්ලිම් ජනතාව ඔහුට සහාය දෙනු ඇතැයි සිතීම තරමක් අසීරුය. ප්‍රබලම මුස්ලිස් පක්ෂය වන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය මේ වන විට කැඩී බිඳී ගොස් ඇති අතර එහි නායකයන්ගෙන් වැඩි දෙනකු සිටින්නේ ආණ්ඩුව සමඟ ය. එනිසා මුස්ලිම් ඡන්ද මහින්දට ලැබීමේ නැමියාවක් තිබේ. ඊට තවත් හේතුවක් වන්නේ මහින්ද පලස්තීන මිත්‍ර සංගමයේ සභාපතිවරයා වීමය.

දෙමළ ඡන්ද සැලකූ විට වතුකරයේ ඡන්ද බහුතරය ඇත්තේ ආරුමුගම් තොණ්ඩමන්ගේ අණසක තුළය. ඔහු කවදත් ඒ ඡන්ද ඔව්වු අල්ලන්නේ දිනන අපේක්ෂකයාටය. එනිසා දනටමත් මහින්ද දිනන බවට ඇති මානසිකත්වය තුළ ඔහුගේ සහාය මහින්දට ලැබෙනු ඇත. කෙසේ වෙතත් ඔහුගේ ප්‍රතිවාදියා වන පී.චන්ද්‍රසේකරන් තමන්ගේ බලපෑමට යටත් ඡන්ද රනිල් වික්‍රමසිංහගේ ජයග්‍රහණය සඳහා යොදවනු ඇත. ඉන්පසුව වැඩිම දෙමළ ඡන්ද ඇත්තේ උතුර නැඟෙනහිරය. නැඟෙනහිර බලය ප්‍රභාකරන්ගෙන් ගිලිහී ඇති අතර දන් එහි රජ කරන්නේ කරුණාය. සතුරාගේ මිතුරා ද සතුරා වන න්‍යාය තුළ කරුණා කිසිවිටෙකත් රනිල් වික්‍රමසිංහගේ ජයග්‍රහණය වෙනුවෙන්

21 වන පිටට

WANT TO GET PR...?

In Australia

Have you completed your Degree/Diploma or course?
Do you have Relatives or Friends in Sri Lanka?
Offshore Skilled Migration Visa

Are you worried about
- How to obtain positive skill assessment.
- Not enough points to apply for Permanent Residency?
- 60 points for occupation?

Time to contact
Hirosh H. Gamage ASA, AAIBF (Snr), MMIA
Multinational Migration Services
20/215, Betula Avenue, Mill Park
Vic 3082, Australia
On 03 94704422 or Fax 03 94704422

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

ශ්‍රී ලංකාවේදී

Who has one or more of the following
- A Trade Certificate/ Diploma/ Degree or Professional/ Technical Qualification?
- Have 1/3/4/6 year(s) experience in a skilled occupation or business?
- Below 45 years
- Good knowledge of English
- Blood Relatives or a business in Australia

Business Owners & Investors/ Visitors/ Spouse/ Parents/ Distinguished talent/ Remaining Relative Visa
Free Student Migration Service
Please contact our staff at Colombo office for further details (FREE SERVICE)

AUSTRALIAN MIGRATION SERVICES
388, (1st Floor), Galle Road, Colombo 03
(In front of Laxshaman's Building)
Tel: 011 2372759 Fax: 011 2372759
E-mail: info@multinational.com.au

AUSTRALIAN MIGRATION SERVICES
Registered Migration Agent No: 0320696

For More details or FREE Online Assessment Visit Our Web Site www.multinational.com.au